සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

නිවාස හා සමාජ සුබසාධන අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமூக நலன்புரி அமைச்சு
MINISTRY OF HOUSING AND SOCIAL WELFARE


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2018.11.28 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2018/14**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත,**

## <u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වර්ෂ අවසාන ගිණුම් පියවීම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම - 2018</u>

### 1. හැදින්වීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය යටතේ පවතින සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා වර්ෂ අවසාන ගිණුම් පියවීම හා 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය මඟපෙන්වීම්, උපදෙස් ලබාදීම මෙමගින් සිදු කරනු ලැබේ. මෙහිදී දැනටමත් නිකුත් කල මෙහෙයුම් උපදෙස් 12 හා ඊට එකතුන් හි සඳහන් පරිදි වර්ෂ අවසාන ගිණුම් පියවීම හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කල යුතුය. ඊට අමතරව මෙමගින් ලබාදෙන උපදෙස් ද අනුගමනය කිරීමට බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් හා කාර්ය මණ්ඩලය වග බලා ගත යුතුය. මෙම වර්ෂ අවසාන ගිණුම් පියවීම කාර්යය 2018.12.31 දින මධ්‍යම රාත්‍රි 12.00 ට පෙර සිදු කර අවසන් කළ යුතු බව අවධාරණය කර සිටිමි.

### 2. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකයින්ට ලාභාංශ ලබාදීම හෝ කොටස් පොළිය ලබාදීම

2.1 2018/13 දරණ චක්‍රලේඛ උපදෙස් පරිදි, 2018 වර්ෂයේ කොටස්කරුවන් සඳහා ලාභාංශ හෝ කොටස් පොලිය ලබාදීමට කටයුතු කළ යුතුය.

### 3. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩල සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දරණ ලද වැටුප්, ගමන් වියදම් ඇතුළු අනිකුත් වියදම් සඳහා ගැලපීම් සිදු කිරීම.

3.1 මෙහෙයුම් උපදෙස් 12 ට පස්වන එකතුවේ සඳහන් පරිදි 2018 වසර තුල සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති නිත්‍ය කාර්ය මණ්ඩල වෙනුවෙන් දරණ ලද වැටුප් සත්‍ය ලෙස ගණනය කර දී ඇති උපදෙස් පරිදි වියදම සටහන් කර තිබිය යුතුය.

3.2 කාර්ය මණ්ඩල වැටුප් ගණනයේදී, පහත කරුනු කෙරෙහි තවදුරටත් ඔබගේ අවධානය යොමු කළ යුතුය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramul**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

3.2.1 වර්ෂය පුරා, යම් නිලධාරියකු බැංකු/බැංකු සමිති සේවයට අනුයුක්ත නොවූ විටක, සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිතියේ රැඳී සිටි රාජකාරී කාලයට ලබාගත් වැටුප පමණක් වැටුප් වියදමට ඇතුලත් කළ යුතුය. (රාජකාරී කාලය අවම වශයෙන් මාස 01 ක් හෝ ඊට වැඩි විය යුතුය.)

3.2.2 වැටුප් සහිත අනුමත නිවාඩු පිට සිටින නිලධාරියෙකුගේ වැටුප, වැටුප් ගණනයේදී ඇතුලත් කළ යුතුය.

3.2.3 වැඩබලන නිලධාරින් බැංකුව/ බැංකු සමිතියට අනුයුක්ත සිටින විට, එම නිලධාරියාගේ වැටුප කාර්ය මණ්ඩල වැටුප් ගණනය ඇතුලත් නොකළ යුතුය. (කිසියම් අවස්ථාවක වැඩ බැලීමේ වැටුප් අනුමත කර තිබුනේ නම් එලෙස ගෙවූ වැටුප් කාර්ය මණ්ඩල වැටුප් ගණනයේදී ඇතුලත් කළ යුතුය.)

3.3 කාර්ය මණ්ඩල වැටුප් ගණනය කිරීමේදී EPF හා ETF අරමුදලට දායකවන නිලධාරින් සිටින විටක, මාසික දළ වැටුපට රජය විසින් දරන ලද 12% EPF හා 3% ETF මුදල් ද එකතු කරගෙන, එක් එක් මාසවලට අදාල වැටුප් ප්‍රමාණයන් ඇතුළත් විය යුතුය. මෙහිදී කිසිදු බැංකුවකට හෝ බැංකු සමිතියකට කාර්ය මණ්ඩල වැටුප් වියදම ඇතුලත් නොකර වාර්ෂික ලාභ අලාභ ගිණුම සකස් කිරීමට අවසරයක් නොමැති බව අවධාරණය කරමු.

3.4 වැන්දඹු, අනත්දරු හා විශ්‍රාම වැටුප් අරමුදලට දායක වන නිලධාරීන්ගේ මාසික දළ වැටුප, (Gross Pay) වැටුප් ගණනයේදී ගත යුතුය.

## 4. අනිවාර්ය ඉතිරි කිරිම්/ සමෘද්ධි සහනාධාර අරමුදල් ගිණුම්ගත කිරිම.

4.1 සමෘද්ධි සහනාධාර අරමුදලින් අනිවාර්ය ඉතිරි කිරිම් ගිණුම්වලට බැර කළ යුතු අරමුදල් ගිණුමේ ශේෂයක් පවතින බැංකු කඩිනමින් එම ශේෂයන් අදාල ගිණුම් හිමියන්ගේ ගිණුම්වලට බැර කළ යුතුය. තවදුරටත් එම ගිණුමේ ශේෂයක් පවත්වාගෙනයාම, 2018 වසර තුල සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල සත්‍යතාවය පිළිඹිබු නොවීමට හේතුවේ.

4.2 සමෘද්ධි සහනාධාර අරමුදලින් ගණුදෙනුකරුවන්ගේ තැන්පතු ගිණුම්වලට බැර කළ යුතු අරමුදල් ගිණුමෙහි, ප්‍රතිලාභීන්ගේ සාමාජික ගිණුම්වලට බැර කිරිමට රැස් කරන ලද අරමුදල් පවතින විටක, බැංකු විසින් කඩිනමින් වැඩසටහන් සකස් කර, එම අරමුදල් ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. එමෙන්ම 2018 වසරෙහි දෙසැම්බර් මසට අදාල සහනාධාර මුදල්, බැංකුවට ලද විගසින් ගිණුම්වලට බැර කිරීම කල යුතුය.

## 5. අනිවාර්ය ඉතිරි කිරිම් ආයෝජන අරමුදල් සඳහා පොලි ලබාදීම.

5.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍රමූල්‍ය අංශයට එවන ලද අනිවාර්ය ඉතිරි කිරිම් ආයෝජන අරමුදල් සඳහා නියමිත පොලි මුදල ලබාදීම සිදුකර ඇත.

5.2 2018 වසර සඳහා පුද්ගලික අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු ගිණුම් හිමියන් සඳහා වාර්ෂික පොලිය 6% අනුපාතයට ගණනය කර, ගිණුම්වලට බැර කිරීම/ වෙන් කිරීම් සිදු කල යුතුය. අනිකුත් තැන්පතු සඳහා දැනට බල පවත්වන පොලී අනුපාත නොවෙනස්ව පවතී.

## 6. සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සව සඳහා ප්‍රජා මූල බැංකු අංශය මඟින් මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම - 2018.

6.1 මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව, 2018 වර්ෂය සඳහා ප්‍රජාමූල බැංකු අංශය ප්‍රතිපූර්ණය කළයුතු අරමුදල් දැනටමත් සමෘද්ධි ප්‍රජා මූල බැංකු වලට ක්ෂුද්‍ර මූල්‍ය අංශය මඟින් ලබාදී ඇත.

6.2 ප්‍රතිපූර්ණ අරමුදල්, මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ වල සඳහන් දිනට පසුව ප්‍රමාදකර, ක්ෂුද්‍රමූල්‍ය අංශයෙන් ඉල්ලුම් කර ඇති විටක අරමුදල් ලබාදීම සිදු නොකිරීමට ප්‍රතිපත්ති තීරණයක් ගෙන

ඇත. එබැවින් තවදුරටත් බැංකුවෙහි ලැබිය යුතු මුදල් ලෙස තබා ඇති සටහන පහත ගිණුම් සටහන් මගින් වියදම් ගිණුමට මාරු කල යුතුය.

හර - වැය ගිණුම උත්සව කටයුතු

බැර - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු අරමුදල් ගිණුම්

## 7. සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති විසින් කරන ලද ආයෝජනවල ශේෂ තහවුරු ලබාගැනීම (2018.12.31 වෙනි දිනට)

7.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු විසින් 2019 ජනවාරි 15 දිනට, පෙර රාජ්‍ය බැංකුවල ආයෝජනය කර ඇති අරමුදල් වලින් 2018.12.31 දිනට කල් නොපිරුණු අරමුදල් පිළිබද ශේෂ තහවුරුවක් ලබාගෙන ආයෝජන ශේෂයන්වල නිරවද්‍යතාවය තහවුරු කළ යුතුය. එම ශේෂ තහවුරු ලිපි සුරක්ෂිතව ගොනු කළ යුතුය.

7.2 සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් ලිඛිතව, බැංකු සමිතියේ කරන ලද ආයෝජන පිළිබද ශේෂ තහවුරුවක් 2019.01.25 දිනට පෙර කඩිනමින් ලබාගෙන අරමුදල් ආයෝජනවල නිවැරදි බව තහවුරු කරගත යුතුය. එමෙන්ම ප්‍රජාමූල බැංකු සමිතිය, බැංකුවලට අදාල ශේෂ තහවුරු ලිපි කඩිනමින් ලබාදීමට බැදි සිටියි.

7.3 ඉහත 7.1 හා 7.2 ඡේදවල සඳහන් උපදෙස් නිසි පරිදි අනුගමනය කර, ලබාගත් ශේෂ තහවුරු අභ්‍යන්තර විගණන නිලධාරි/ බාහිර විගණන නිලධාරීන්ට විගණනය සඳහා භාජනය කරන බැවින් සුරක්ෂිතව තබා ගත යුතුය.

## 8. වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම.

8.1 2018 වර්ෂයට අදාල පහත ප්‍රකාශන සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති විසින් සකස් කිරිම කළ යුතුය. (හඳුන්වා දී ඇති ආකෘතින්ට අනුකූලව)

8.1.1 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය.
8.1.2 2018.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය.)
8.1.3 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
8.1.4 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය.
8.1.5 ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය.

8.2 ඡේද 8.1.1 හා ඡේද අංක 8.1.2 හී සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමට උපයෝගි කරගත් සටහන් ද පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය.

8.3 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයට සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන, බැංකු/ බැංකු සමිති වල බැංකු පාලක මණ්ඩල/ විධායක කමිටු වෙත ඉදිරිපත් කළ යුතුය.

8.4 2018 වර්ෂයේ බාහිර විගණනය සිදුකර දෙන ලෙස කරන ලද ඉල්ලීම සහිතව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් 2019.02.28 දිනට පෙර ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. එහි පිටපත දිස්ත්‍රික් සමෘද්ධි අංශයට ඉදිරිපත් කළ යුතුය.

8.5 විගණනය සඳහා ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන කට්ටලය, සකස් කිරීමේදී ඉතා අකාර්ශනීය ලෙස සකස් කරන ලෙසත්, සමෘද්ධි බැංකු/ බැංකු සමිති ගොඩනැගිල්ලේ ඡායාරූපයක් මුල් කවරයට ඇතුලත් වන්නේ නම් ඉතා උචිත වේ.

## 9. මාසික බැංකු ප්‍රගති වාර්තා ලබාදීම.

9.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු වලින්, 2018 වසර සඳහා වර්ෂ අවසාන ගිණුම් පියවීමට කටයුතු සිදු කළ යුතුය. ඒ අනුව ගිණුම් පියවීමට පෙර හා පසු ශේෂ පරික්ෂණය සකස් කිරිම අවසන් කර, සුපුරුදු පරිදි ප්‍රගති වාර්තා හා ශේෂ පරික්ෂණ (පෙර/ පසු) හඳුන්වාදී ඇති ආකෘතියට අනුව සකස් කර 2019.01.05 දිනට පෙර සංයුක්ත තැටියක් (CD) මගින් හෝ විද්‍යුත් ලිපිනයෙන් (E-mail) බැංකු සමිතිය වෙත ලබාදීම සිදු කළ යුතුය. බැංකු සමිතිය විසින් 2019.01.10 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අංශය වෙත යොමුකළ යුතුය.

9.2 දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් සියළුම ප්‍රජා මූල බැංකු/ බැංකු සමිති වල මාසික තොරතුරු 2019.01.20 දිනට පෙර ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයට එවිය යුතුය.

## 10. 2018 වර්ෂයේ වර්ෂ අවසාන ගිණුම් පියවීම හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති සඳහා සති අන්ත දින රාජකාරීවල නිරත වීම හා දින වැටුප් ලබාගැනීමට අවසර දීම.

10.1 2018 වර්ෂයේ අවසාන ගිණුම් පියවීම් කටයුතු හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම කඩිනම් කිරීම් සඳහා පෙර/ පසු සුදානම්වීම සඳහා 2018 දෙසැම්බර් මස 29 හා 30 දින ද, 2019 ජනවාරි මස මුල්ම සති අන්ත දිනවල දින 02 ක් ද, ඇතුළුව දින 04 ක් සති අන්ත නිවාඩු දිනවල රාජකාරි යෙදවීමට ඉඩ දෙනු ලැබේ. (දැනටමත්, මෙහෙයුම් උපදෙස් වලින් ලබාදී ඇති සති අන්ත රාජකාරි දිනවලට අමතර වේ.)

10.2 ඉහත ඡේද අංක 10.1 පරිදි කටයුතු කිරීමට, බැංකු විවෘත කර බැංකු කාර්ය මණ්ඩලය රාජකාරිවල නිරත වී සති අන්ත දින වල වැටුප් ලබාගැනීමට ඉඩදෙනු ලැබේ. තවද, සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කාර්ය මණ්ඩල සඳහා 2018 දෙසැම්බර් මස 30 හා 2019 ජනවාරි 05 දින දෙකෙහි පමණක් රාජකාරිවල නිරතවීමට අවසර ඇත. ඒ සඳහා බැංකු සමිති කාර්ය මණ්ඩලයට දින වැටුප් ලබාගත හැක.

## 11. තෛයිපොංගල් දිනය සැමරිම.

හින්දු ජනතාව විසින් භක්තියෙන් සමරන තෛයිපොංගල් උත්සවය 2019 ජනවාරි 14 දින යෙදී ඇත. එම උත්සවය වෙනුවෙන් සිරිත් විරිත් ආගමානුකූලව සිදුකර ඊට සමගාමීව තැන්පතු ප්‍රවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කිරිමට ද අවශ්‍ය උපදෙස් ලබාදෙමු.

## 12. 2019 නව වසර සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු කටයුතු ආරම්භ කිරීම

13.1 2019 නව වසරෙහි පළමු රාජකාරී දිනය 2019 ජනවාරි 01 දිනට යෙදී ඇති අතර එදින ගණුදෙනු සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකුව වෙත පැමිණෙන ලෙස ගණුදෙනුකරුවන්ට සුහදත්වයෙන් ආරාධනා කල යුතුය.

13.2 එදින සිංහල/දෙමළ චාරිත්‍ර අනුව දේශිය රසකැවිලි කිහිපයක් සහිතව තේ පැන් සංග්‍රහයක්, ප්‍රජාමූල බැංකුවේ වියදමින් පැවැත්වීමට කටයුතු කල යුතුය. එම සංග්‍රහය ප්‍රජාමූල බැංකුව වෙත පැමිණෙන ගණුදෙනුකරුවන්ට, පාලක මණ්ඩල සාමාජිකයින්ට, වසම්වල රාජකාරී කරන ක්ෂේත්‍ර නිලධාරීන්ට සුහදත්වයෙන් පිරිනැමීමට කටයුතු කල යුතුය. මේ සඳහා රු.5,000ක

උපරිමයකට යටත්ව වැය දැරිය යුතු අතර වැය ගිණුම සංග්‍රහ වියදම් යටතේ ගිණුම් තැබීමට ද අනුමැතිය ලබාදෙන්නෙමු.

## 13. 2019 නව වසරට සුභ පැතුම් එකතු කිරීම.

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ අරමුණු සාක්ෂාත් කරමින් සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්වය උසස් කරමින් ඔවුන්ට පැහැබර අනාගතයක් උදා කරලීමේ මහගු කාර්යභාරයක් ඉටුකරමින් 2018 වර්ෂය තුල සමෘද්ධි ප්‍රජාමූල බැංකු /ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් ද දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/ ප්‍රාදේශිය ලේකම්වරුන්/ මූලස්ථාන කළමනාකරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය ද, ප්‍රජාමූල සංවිධාන ප්‍රජා නායකයින් ඇතුළු අප සමඟ අත්වැල් බැඳගත් සියළුදෙනා දැක්වූ සහයෝගය අගය කරන අතර,**

**“2019 වසර සියළු දෙනාට සුභ නව වසරකට සුභ පැතුම් සඳහා ආශිර්වාද ගෙන එන්නෙමු.”**

නිමල් කොටවලගෙදර
අධ්‍යක්ෂ ජනරාල්. (වැ.බ.)

<u>පිටපත් :-</u>

1. ලේකම්, නිවාස හා සමාජ සුභසාධන අමාත්‍යාංශය. - කා.දැ.පි
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්. - කා.දැ.පි
3. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
4. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව . - කා.දැ.ස.